## 2019 ජූලි මස සාංඝික පවුල් දින සුපුවත
## යාගයක්, වැඩ විසීමක්, භෝජනයක් වූ
## දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ තුළ පිතෘක මාතෘක ප්‍රේමය

01. ආරම්භක ප්‍රශංසාව :
   පුබුදු ගී අංක 10 "ශුද්ධාත්මයාණෙනි වඩිනු මැනේ...."

02. ප්‍රශංසාවට හැඳින්වීම :
   **"දෙවියන් වහන්සේ ප්‍රේමයය. ප්‍රේමයෙහි ජීවත් වන්නා ඔවුන් වහන්සේ තුළ ජීවත් වෙයි. දෙවියන් වහන්සේ ද ඔහු තුළ ජීවත් වන සේක."** (1ජොහාන් 4:16)

   දේව ස්වරූපය, සමානකම තිළිණයහක් ලෙස ලබා මෙලොව උපත ලද මිනිසා, ආත්මාර්ථකාමයේ, මමත්වයේ පාපයට වහලෙකු වෙමින් තමන් සතු උරුමය විනාශ කර ගන්නට උත්සාහ කළද ප්‍රේමය වන දෙවියන් වහන්සේ මනුෂ්‍යයෙකු වෙමින් බැහැපත් වූ සේක. සර්වබලධාරි දෙවියන් වහන්සේ මාංශගත වෙමින් අප සමඟ නතර වන්නට වැඩිය සේක. දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ තුළ මවක් මෙන් තම දරුවන් පෝෂණය කරන පියෙකු මෙන් තම දරුවන් රැකබලා ගන්නාවූ ඔවුන් වහන්සේට වන්දනා නමස්කාර කරන්නට, ස්තූති ප්‍රශංසා කරන්නට අප සූදානම් වෙමු.
   පුබුදු ගී අංක 129 "පූර්ණයාණෙනි...."

03. ආපසු බැලීම :
   i අබ්බා තාත්තේ - අබ්බා අම්මේ කියමින් ඉතා සමීපව දෙවියන් වහන්සේගේ පිතෘක මාතෘක ආදරය අත්දකින්නට හැකිවූ අවස්ථාවන් පිළිබඳ බෙදා ගන්න.
   ii ඔබ තුළින් පියාණන් වහන්සේගේ පිතෘක ආදරය හා මාතෘක ආදරය අන් අය අත්දකිනු ලැබූ අවස්ථාවන් තිබේද?

04. දවසේ සුපුවත :
   **යාගයක්, වැඩසිටීමක් සහ භෝජනයක් වූ දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ තුළින් ප්‍රකාශ වන පිතෘක - මාතෘක ප්‍රේමය මහා අභිරහසකි.**

### i යාගයක් වූ දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ තුළ පිතෘක - මාතෘක ප්‍රේමය

* දිව්‍ය සත්ප්‍රසාදීය යාගය තුළ පවතින විශ්ව ත්‍යාගශීලී ගුණය, ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේම වචනවලින් අපට පැහැදිලි වේ. දිව්‍ය සත්ප්‍රසාදය ස්ථාපිත කරන විට ඔවුන් වහන්සේ හුදෙක් " මේ මාගේ ශරීරයය" "මේ මාගේ රුධිරය" යනුවෙන් නොපවසා "ඔබ වෙනුවෙන් වගුරුවන ලද" යන වචන ද එක් කළ සේක. මවක තම දරුවාට ඇගේ රුධිරය කිරට හරවා බොන්නට දෙන ලෙස දෙවියන් වහන්සේ මාංශගතවූ සමිඳාණන් ලෙස සිය රුධිරය වගුරුවමින් යාගයක් වෙමින් දේව ජනතාව පෝෂණය කරන සේක.

* සියල්ලන්ගේ විමුක්තිය සඳහා කුරුසිය මත පූජා කරනු ලබන ඔවුන් වහන්සේගේ යාගය සක්‍රමේන්තු ආකාරයෙන් පැවතීමට සැලසීමෙන්, යාගයක් වූ දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ තුළ පිතාක - මාතෘක ආදරය සෑම දිව්‍ය පූජා යාගයක් තුළම අත්දකින්නට අපට සලසා දී ඇත.

### ii වැඩසිටීමක් වූ දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ තුළ පිතෘක - මාතෘක ප්‍රේමය

"සදහටම මම ඔබ සමඟ සිටිමි." (ශු.මතෙව් 28:20)

* දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ යනු දෙවියන් වහන්සේගේ ප්‍රේමයේ ජීවනය අපේ ඇස්වලින් දකින, ස්පර්ශ කරන අපේ හදවතට දැනෙන සක්‍රමේන්තුමය ප්‍රකාශනයයි. දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ දෙවියන් වහන්සේගේ ස්වකීය සභාව නමැති දරුවා සමඟ සදහටම වාසය කිරීම ඒ තුළින් ස්ථිර කෙරේ. දිවා රැයේ තම දරුවන් දෙස දෑස් දල්වා බලා සිටින මෑණියන් ද, ඔවුන් රැකවල් කරන පියාණන් ද වන දෙව් මහෝත්තමයාණන්ගේ පිතෘක - මාතෘක ප්‍රේමය දිව්‍ය සත්ප්‍රසාද වහන්සේගේ වැඩසිටීම තුළින් අත්දැකිය හැකිය.

### iii භෝජනයක් වූ දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ තුළ පිතෘක මාතෘක ප්‍රේමය

* "ස්වර්ගයෙන් පහළ වූ ජීවනදායක ආහාරය මමය. යමෙක් මේ ආහාරය වැළඳුවහොත් ඔහු සදහටම ජීවත් වන්නේය. " (ශු.ජොහාන් 6:51-58)

මෙම ජීවනදායක ආහාරය තම මාංශය බව ඔවුන් වහන්සේ ප්‍රකාශ කරයි. ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ තම ජීවිතයම අප උදෙසා පූජා කරමින් ජීවනදායක ආහාරය බවට පත් වෙමින් අප තුළ නැති වෙයි. අපව ඇති කරයි.

* තම ජනතාව පෝෂණය කිරීම සඳහා දෙවියන් වහන්සේ තුළ පැවති ආශාව නික්මයාම ගමනේදී 'මන්නා' සැපයීම තුළින් ද (නික්මයාම 16:31-36) නව ගිවිසුම තුළ පන්දහසකට ආහාර දීම පිළිබඳව ප්‍රාතිහාර්ය තුළින් ද (ශු.ජොහාන් 6:4-15) පැහැදිලි වන්නේ දෙවියන් වහන්සේගේ පිතෘක - මාතෘක ආදරයයි. ආහාරය හැම විටම අනුභව කළ පසු මිනිසාගේම කොටසක් බවට පත් වේ. මෙලෙස වර්ථමානයේ දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ අප ජීවිත වෙත භෝජනයක් වී දෙවියන් වහන්සේගේ පිතෘක - මාතෘක ආදරය රැගෙන එයි.

05. ප්‍රායෝගික වීම සඳහා :

i දිව්‍ය රහස් කිරීමේ වචන ප්‍රකාශ කිරීමේදී දිව්‍ය සත්ප්‍රසාදීය ක්‍රිස්තුන් වහන්සේ සමඟ ඒකාබද්ධ වෙමින්, මුළු සිතින් අබ්බා පියාණන්ගේ අබ්බා අම්මාගේ කැමැත්ත කරන්නට පූර්ණ එකඟතාවය, කැමැත්ත ප්‍රකාශ කරමු. ඊට පිපාසා වෙමු.

ii එසේම දිව්‍ය යාගයට සම්බන්ධ වෙමින් දිව්‍යමය භෝජනයක් ලබා ගැනීමට අප ශාරීරික හා මානසික වශයෙන් සූදානම් වෙමු. අප අඳින පළඳින දේ ගැනද භෝජනයට පෙර ශාරීරික උපවාසයද ඉතා වැදගත් කරුණකි.

iii සතිය පුරා අප ලද විවිධ අත්දැකීම් (දුක,සැප,කරදර යනාදි) මුල් කරගෙන තුති පුදමින් අබ්බා තාත්තා අබ්බා අම්මා අභියස පෙනී සිටිමු.

iv පවුලක් ලෙස විශේෂයෙන් ඉරුදිනට නියමිත දේව ප්‍රකාශණ මෙනෙහි කරමින් නිසි ලෙස සූදානම් වෙමු.

07. අවසාන යැදුම :

* දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ යාගයකි, වැඩ සිටීමකි, භෝජනයකි. මෙම මහා ගැඹුරු සත්‍යතාවය භුක්ති විඳීමේ වරම් පතා, ආත්මයාණන් වහන්සේගේ බලය පතා යාච්ඤා කරමු.
* පුබුදු ගී අංක 113 "බාධක පීඩා...."

**************************

අවධානය සඳහා :

* 2019 ජූලි මස 16 වන අඟහරුවාදා (පෝය දින) සුරැඳි දූවරුන්ගේ වාර්ෂික දිනය පෙ.ව.09.00 - ප.ව.04.00 දක්වා ශ්‍රී ප්‍රශංසාරාමයේදී පැවැත්වේ.
* 2019 ජූලි මස 20-21 දිනවල සියළුම වගකීම් ගන්නා අය සඳහා කඳවුර 20දා පෙ.ව.09.30 සිට 21දා දිවා ආහාරය දක්වා ප්‍රශංසාරාමයේදී පැවැත්වේ.